


# ආහාර හිඟයෙන් යාල අලි පැටව් වැඩි හරියක් මිය යනවා

3205 readers have read this article !

By **mawbima**
2017-09-15






සපුමල් ජයසේන

ආහාර හිඟය නිසා යාල ජාතික වනෝද්‍යානයේ වෙසෙන අලි පැටවුන්ගෙන් හරි අඩකට වඩා වැඩි සංඛ්‍යාවක් මියයන බව ඒ පිළිබඳව පර්යේෂණයක් සිදු කළ පර්යේෂණ සංරක්ෂණ ආයතනයේ සභාපති ආචාර්ය පෘථුවිරාජ් ප්‍රනාන්දු මහතා පවසයි.
යාල වනෝද්‍යානයට මාස ගණනාවක් තිස්සේ පැවැති දැඩි නියං කාලගුණ තත්ත්වය නිසා අලින්ට සහ පැටවුන්ට ආහාර සඳහා ලබාගත හැකි ගස් කොළන් වියළී ඉපල් බවට පත්ව ඇත. පැටවුන් වැඩියෙන්ම ආහාරයට ගන්නා තණ මැරී ගොස් තිබේ.

නියං සමයේ අවසන් කාල පරිච්ඡේදය වන විට පෝෂණ උ◌ෟනතාවයන් නිසා වැලඳෙන රෝගවලට ගොදුරු වීමෙන් අලි පැටවුන් විශාල ලෙස මියයන බව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ උසස් නිලධාරියෙක් සඳහන් කරයි.

පසුගිය 2004 වසරේදී යාල ජාතික වනෝද්‍යානය සහ ඊට යාබදව පිහිටි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් කැලෑව වෙන් කොට අලි විදුලි වැටක් ඉදිකිරීමෙන් අනතුරුව යාල ජාතික වනෝද්‍යානයේ වෙසෙන අලි ඇතුන්ට මේලෙස නියං සමයේදී දැඩි ආහාර හිඟයකට මුහුණ දීමට සිදුව තිබෙන බව පෘථුවිරාජ් ප්‍රනාන්දු මහතා කියා සිටී.

අලි ඇතුන්ට අවශ්‍ය ආහාර බහුලව ඇත්තේ යාලට යාබදව පිහිටා ඇති වන සංරක්ෂණ කලාපයේ බවද මෙම විදුලි වැට ඉදි කිරීමෙන් පසුව යාල වනෝද්‍යානයේ අලි එම වනෝද්‍යානය තුළටම කොටුවී සිටින බවද ආචාර්ය පෘථුවිරාජ් ප්‍රනාන්දු මහතා වැඩිදුරටත් පැවැසීය.

තීරු ලිපි

## අද මව්බිමෙන්

- සියවැනි ජන්ම දිනයේ අරුම පුදුම හමුවීමක් 2839 2017-09-19
- ආණ්ඩුවේ හරි දේවල් හරි කියනවා වගේම වැරුදි දේවල් හරි කියලා දොහොත් මුදුන් දෙන්නේ නෑ 2784 2017-09-19
- ආහාර නිෂ්පාදන සංග්‍රාමයට සහාය පළ කරමින් මාත්සය පැටවුන් මිලියන පහක් ජලාශවලට මුදාහැරේ 2756 2017-09-19
- වැලිඔය ගංජා වැටලීමට ගිය පොලිස් කණ්ඩායමට පහරදුන් 18 දෙනා අත්අඩංගුවට 2757 2017-09-19
- සංවර්ධන ලොතරුැයි මණ්ඩලයේ සභාපති ඉවත් කළාසේම ජාතික ලොතරුැයි මණ්ඩලයේ සභාපතිනියත් ඉවත් කළ යුතුයි 2762 2017-09-19
- එංගලන්තයේ රුකියා කරන සරත් විමලවීර සිය මවගේ 92 වැනි උපන් දිනය සමරා ලක්‍ෂයක ඇස් කණ්ණාඩි ලබාදෙයි 2776 2017-09-19
- බුදු දහමට කුලවාදය, නිකායවාදය, ජාතිවාදය, ප්‍රදේශවාදය, පුද්ගලවාදය හා දේශපාලනය ඇතුළු වීමෙන් නිර්මල දහම ඉතා වේගයෙන් පරිහානිය කරා ගමන් කරනවා කොස්ගොඩ විමලවංශ නාහිමි 2778 2017-09-19
- ජනාධිපති විද්දේශගත වීමෙන් රුස්වීම කල්යයි 2756 2017-09-19
- සණස සභාපතිනියට ඇසිඩ් ගැසූ සැකකරුවන් යළි 25 දා තෙක් රක්ෂිතයට 2766 2017-09-19
- සිල් රෙදි නඩුවේ දඩය ගෙවන්න ඕනෑ මහජනතාව නෙවෙයි : මහින්ද රාජපක්ෂයි 2799 2017-09-19
- තොරතුරු දැනගැනීමේ පනතේ සාර්ථකත්වය ගැන පුළුල් ප්‍රචාරයක් 2750 2017-09-19
- ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් ආයතන සංග්‍රහය උල්ලංඝනය කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුරේ වැඩ බලනවා

Custom Search







Rupee Exchange R

| | |
|---|---|
| Australian Dollar | |
| Swiss Franc | |
| Euro | |
| British Pound | |
| Hong Kong Dollar | |
| Japanese Yen | |
| American Dollar | |

19

